15 හැවිරිදි බාලවයස්කාර දැරියක ලිංගික අපයෝජනයකට ලක් කළ උපකාරක පංති ගුරුවරයෙකු අත්අඩංගුවට ගැනීමේ පුවතක් අරුණ පුවත්පතේ සහ අද පුවත්පතේ (දෙසැම්බර් 02, 2022) දැක්වී තිබුණේ මේ ආකාරයෙනි.

* "මල් කැකුළ තැළූ ටියුෂන් බඹරාගේ රෙදි ගැළවෙයි"- අරුණ සිරස්තලය

* "පාසල් සිසුවිය අපයෝජනය කළැයි උපකාරක පංති ගුරුවරයා රිමාන්ඩ්" - අද සිරස්තලය

1) ලිංගික අපයෝජනයක් හැඳින්වීම සඳහා ඊට මුහුණ දුන් අයගේ ජීවිතය අවසන් බවට/ජීවිතය විනාශ වූ බවට හඟවන විවිධ යෙදුම් මාධ්‍ය විසින් යොදාගැනීමේ ගැටළුව පිළිබඳ Ethics Eye අපි මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. ලිංගික අපයෝජනයක් යනු "මල් කැකුළක් තැළීමක්" ලෙසට අරුණ සිරස්තලයෙන් දැක්වීම ඔස්සේ, එම දැරියට එල්ල විය හැකි සමාජ ගර්හාව හා කොන් කිරීම වැඩි නොවනු ඇතිද?

2) ඒ වෙනුවට මෙහිදී වඩාත් යෝග්‍ය වන්නේ "ලිංගික අපයෝජනය" යන යෙදුම නොවන්නේ ද?

3) අරුණ සිරස්තලය හැඟීම් කළඹවන සුළු (sensationalised) එකක් යැයි ඔබ නොසිතන්නේ ද? ඒ ඔස්සේ එම සිදුවීම සහ ඒ පසුපස ඇති සමාජ ගැටළුවට යොමු විය යුතු අවධානය පාඨකයාගෙන් ගිලිහී නොයන්නේ ද?

** Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.